# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2150/41 - 2019 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ප්‍රකාශනයයි

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/1/1/10.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද ඡන්ද විමසීමක දී, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දෙදහස් දහනවයක් වූ නොවැම්බර් මස දහහත් වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලැබූ හෙයින් ද,

එකී ජනාධිපති ගේ ධූර කාලය එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (4) ව්‍යවස්ථාව ප්‍රකාර, දෙදහස් දහනවයක් වූ නොවැම්බර් මස දහහත් වැනි දිනයෙන් ආරම්භ වූ හෙයින් ද,

එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 අ (7) ව්‍යවස්ථාව සමග කියවනු ලබන 32 ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවැනි හා හත්වැනි උපලේඛනවල දැක්වෙන ප්‍රතිඥාවන් දී ඊට අත්සන් තැබීමෙන් දෙදහස් දහනවයක් වූ නොවැම්බර් මස දහඅට වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරය භාර ගත් වග මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ බව සියලු දෙනාම මෙයින් දැනගත යුතු ය.

වර්ෂ දෙදහස් දහනවයක් වූ නොවැම්බර් මස දහඅට වැනි දින අනුරාධපුර දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමා ගේ අණ පරිදි,

පී.බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

2019 නොවැම්බර් මස 19 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.

12 - 115


1A - G 31530 — 387 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*